ලංකා ඛණිජවැලි සමාගම - 2020
-----------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලංකා ඛණිජවැලි සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ  මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින්  ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ  වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ  වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනයක් විසින් පෙර කාලපරිච්ඡේදයට අදාළව ප්‍රමාණාත්මක වැරදි සොයා ගැනීමෙන් පසුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) අංක 8 හි 42 වගන්තිය ප්‍රකාරව ඒවා අතීතානුයෝගීව නිවැරදි කළයුතු වුවත් සමාගම විසින් 2019 අගෝස්තු 12 දින මිලදී ගෙන එම වර්ෂයේදීම භාවිතයට ගෙන තිබූ රු.71,565,328ක් වටිනා Wet High Intensity Magnetic Separator With a Control panel Board යන්ත්‍රය 2020 වර්ෂයේ මිල දී ගත් යන්ත්‍රයක් ලෙස ගිණුම්වලට ගෙන 2019 වර්ෂයට අදාළ රු.2,981,890 ක් වූ ක්ෂය වීම් පෙර වර්ෂයේ ලාභයට නොගලපා 2020 වර්ෂයේ වාර්ෂික ක්ෂය වීම් වලට එකතු කර ගලපා තිබුණි. | ආයතනය විසින් යන්ත්‍රාගාරයත් සමග සාකච්ජා කර 2020 වර්ෂයේ ප්‍රාග්ධනිත වත්කමක් ලෙස සලකා 2020 වර්ෂයේ ගිණුම් වලට ගලපන ලද අතර පෙර වර්ෂයට නොගලපන ලදී. | ප්‍රමිතිය ප්‍රකාරව ක්ෂය වීම් කාලපරිච්ඡේදයට අදාළව ගැලපීම් කළ යුතුය. |
| (ආ) | දේපල, පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 වන ඡේදයට අනුව, වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකදීම සමාලෝචනය කරනු ලැබිය යුතු අතර ඵලදායී ජීව කාලය කලින් ඇස්තමේන්තු වලට වඩා වෙනස් නම්, වෙනස්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 8 අනුව ගිණුම්ගත කළ යුතු වුවත්, සම්පූර්ණයෙන් ක්ෂය වී ඇතත් දැනට භාවිතයේ පවතින පිරිවැය රු.175,746,070 ක්වූ මෝටර් වාහන හා පිරිවැය රු.45,294,704 ක්වූ ගොඩනැගිලි වල ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම්ගත කර නොතිබුණි. | මෙම මෝටර් වාහන හා ගොඩනැගිලි පිළිබඳව ප්‍රත්‍යාගනනයක් සිදු කිරීමට සාකාච්ඡා කර තිබුණද ගෝලීය කොවිඩ්-19 වසංගත තත්වය හමුවේ එය සිදු කිරීමට නොහැකි විය. | ප්‍රමිතියේ ප්‍රතිපාදන ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කර ඒ අනුව ගිණුම් වල අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දී කිසිදු අලෙවියක් සිදු වී නොමැති ඛනිජ වර්ග කිහිපයක අවසන් තොග භෞතික සත්‍යාපනයේදී පොත් ශේෂය හා භෞතික ශේෂය අතර මෙ.ටොන් **4,991** සිට මෙ.ටොන් **1,274** ක පරාසයක අතිරික්ත හා ඌනතා වෙනස්කම් ඇතිවී තිබුණි. තොගයන්හි ඇතිව තිබූ එම වෙනස්කම් වලට හේතු හඳුනාගැනීමකින් හා විධිමත් අනුමැතියක් ලබාගැනීමකින් තොරව තොගයට ගැලපීම් කර එයට අදාල නොවන නිෂ්පාදන පිරිවැයක් පාදක කර ගිණුම් වලට ගැලපීම හේතුවෙන් අවසන් තොගය හා වර්ෂයේ ලාභය රු.**40,277,578**කින් වැඩි වී තිබුණි. | තොග වෙනස් වීම් ගැලපීමේදී තොග පිරිවැය වෙළඳ ගිණුම් වල **(Trading A/C s)** හා තොග ගිණුම් වල **(stock A/C s)** වල නිවැරදිව ගලපන ලදී. | පොදුකාර්ය පිරිවැය ගණනය කර අවසන් කර ඇති තොගයන්ට නැවත පොදුකාර්ය පිරිවැය ගැලපීමක් නොකල යුතු අතර භෞතික තොග වෙනස පමණක් අදාල තොග ගිණුමට ගැලපිය යුතුය. |
| (ආ) ඉල්මනයිට් සඳහා ලබාගන්නා දළවැලි අවසාන තොගය මෙ.ටොන් **151,762**ක් වුවද ගිණුම් ගත කර ඇති ප්‍රමාණය මෙ.ටොන් **149,065**ක් විය. ඒ අනුව මෙ.ටොන් **2,696** ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් දළවැලි අවසන් තොග වටිනාකම රු.**1,058,233** ක් අඩුවෙන් හා **B** යන්ත්‍රාගාරයේ නිෂ්පාදන පිරිවැය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | **2021** වර්ෂයේ ගිණුම් වලට ගැලපීම් සිදුකොට නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | නිවැරදි තොග අගය ගිණුම් ගත කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **2011** ජනවාරි **9** දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව සමාගම විසින් රු. මිලියන **500** ක මුදලක් පිහන් සංස්ථා සේවක වන්දි ගෙවීම සඳහා රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව වෙත **2012** ජනවාරි **10** දින ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී මෙම ණය වෙනුවෙන් රු.**103,484,290**ක අඩමාන ණය වෙන් කර තිබූ අතර රු.**517,421,448** ක් වූ ණය මුදල හා පොලිය සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගෙන නොතිබුණි. | අය කර ගැනීමට දැනට නෛතිකව කටයුතු සිදු කරන අතර ඉදිරියේදී ආයතනය විසින් මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ලාභාංශ සඳහා වසරකට රු.මිලියන **50** බැගින් ලාභාංශ වලට හිලව් කිරීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ණය හා පොළිය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | **2012 වර්ෂයේ පමණ සිට වැව්ලි සංස්ථාවට හා ජාතික කඩදාසි සංස්ථාවට ලබාදී තිබූ පිළිවෙලින් රු.25,000,000 හා 5,000,000 ක ණය මුදල් අය කරගැනීමට සමාගමට නොහැකිවී තිබුණි.** | රාජ්‍ය වැව්ලි සංස්ථාවෙන් ලැබිය යුතු රු.මිලියන 25ට සරිලන පරිදි ඉඩමක් ලබා ගැනීමට හා ජාතික කඩදාසි සංස්ථාවේ වත්කම් අලෙවි කළ පසු ආයතනයේ මුදල් ගෙවීමට එකඟතාවය පලකර ඇත. | මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණවත් වෙන් කිරීමක් කළයුතු අතර මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) **2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය** | **අබලන් වූ හා භාවිතා කිරීමට නොහැකි වාහන අපහරණය කිරීමට කටයුතු කල යුතු බව සඳහන් වූවද වසර 2ත් වසර 10ත් අතර කාලයක සිට ධාවනයෙන් ඉවත් කර ඇති සමාගම සතු වාහන 08 ක් අපහරණය කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.** | වාහන විකිණීම සඳහා මිල ගණන් කැඳවා ඇත. | **චක්‍රලේඛ නියමයන් අනුව අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.** |
| (ආ) **2020 ජනවාරි 27 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය** | **රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් ක්ෂේත්‍ර 6ක් යටතේ අධ්‍යක්ෂවරු 3දෙනා බැගින් උපකමිටු පත්කර, පුල්මුඩේ ක්ෂේත්‍ර සංචාරය වෙනුවෙන් රු.200,000ක් ගෙවා තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා මාසික දීමනාව රු.25,000 ඉක්මවිය නොහැකි බව සඳහන් වුවද චක්‍රලේඛ ප්‍රතිපාදන වලට පටහැනි රැස්වීම් සඳහා සහභාගි වූ දෙදෙනෙකුට එම සීමාව ඉක්මවා රු.60,000ක් බැගින් දීමනා ගෙවා තිබුණි. ක්ෂේත්‍ර සංචාරය කිරීම වෙනුවෙන් කිසිඳු වාර්තාවක් මෙම නිලධාරීන් විසින් සමාගමට ලබා දී නොතිබුණි.** | **සමාගම සකසුරුවම් ලෙසත්, කාර්යක්ෂමතාවයකින් යුක්තව ඵලදායි ලෙස අදාළ කාල සීමාවන් තුල නීති රීති, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාවට නංවනු ලැබේ.** | **චක්‍රලේඛ නියමයන්ට පටහැනිව කටයුතු නොකළ යුතුය.** |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 50,797,328 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.2,277,746,050ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,328,543,378 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉල්මනයිට් විකුණුම් ටෙන්ඩර් අවලංගු වීම, තොග අලෙවි නොවීම, තොග ඉවත් නොවීමෙන් ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවීම හා ගබඩා පිරී තිබීමෙන් ඉල්මනයිට් නිෂ්පාදනය මාස 06ක් පමණ සිදුනොවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාගමේ ශුද්ධ විකුණුම් 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේදී 82% කින් පහත වැටී තිබුණු අතර ඊට සාපේක්ෂව විකුණුම් පිරිවැය 71% ක ප්‍රතිශතයකින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ලබා දී තිබූ විකුණුම් ටෙන්ඩර් අවලංගු වීම හා මෙ.ටොන් 85,000 ක ඉල්මනයිට් ටෙන්ඩරයෙන් 2020 දෙසැම්බර් 31 දින වන විටත් මෙ.ටොන් 5032.86 ක් පමණක් නිදහස් කරගෙන තිබීමෙන් ආදායම අඩුවීම නිසා මෙම පිරිහීම ඇතිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉල්මනයිට් මෙ.ටොන් 85,000ක ටෙන්ඩරය සඳහා ලංසු 4ක් ලැබී තිබූ අතර මෙ.ටොන් 01 කට ඇ.ඩො. 165.20 ක ඉහලම මිල ලංසුව නිසි වගකීමකට බැඳුනු ලංසු සුරක්ෂණයක් නොවන බව දක්වමින්ද , ඇ.ඩො.163 ඉදිරිපත් කළ දෙවන මිල ලංසුව මෙ.ටොන් 5,000ක් සඳහා පමණක් බව දක්වමින්ද ප්‍රතික්ෂේප කර තිබුණි. පසුගිය වසරේ මූල්‍ය වාර්තා ඉදිරිපත් කළ යුතු වුවද එම වාර්තා ඉදිරිපත් කර නොතිබියදීත් තෙවන මිල ඇ.ඩො. 147 කට එකඟ වූ ලංසු කරුට ටෙන්ඩරය ප්‍රදානය කර තිබුණි. මේ නිසා ඉහලම මිල ඉදිරිපත් කළ ලංසුකරුට ටෙන්ඩරය ප්‍රදානය කිරීමට එකඟතාවයකට පත් නොවීමෙන් මෙ.ටොන් 01 කට ඇ.ඩො.18.20 බැගින් මෙ.ටොන් 85,000කට ඇ.ඩො.1,547,000 ක පාඩුවක් ආයතනයට සිදුවී තිබුණි. ඇ.ඩො.147 බැගින් මෙ.ටොන් 85,000 දින 130 ක් ඇතුලත නිදහස් කිරීමට එකඟව 2020 ඔක්තෝම්බර් 28 දින ඉල්මනයිට් විකිණීමේ ටෙන්ඩරය ප්‍රදානය කර තිබුණද මෙ.ටොන් 25,000 කට ඇ.ඩො. 3,675,000ක් ගෙවා සමාලෝචිත වර්ෂය අවසානයට මෙ.ටොන් 5,032.86 ක් හා 2021 මාර්තු අවසන් වන විට තවත් | අධ්‍යක්ෂ මණ්ඩල හා කැබිනට් අනුමැතියෙන් ඇ.ඩො. 147 කට එකඟව ලංසුකරුට ටෙන්ඩරය ප්‍රදානය කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කර උපරිම තරඟකාරිත්වයක් තුලින් ඉහල මිලක් ලබාගැනීමට කටයුතු කලයුතු අතරම ආයතනයට වාසිදායක වන පරිදි තීරණ ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඇ.ඩො.2,940,000 ක් ගෙවා 30,000 ක පමණ ප්‍රමාණයක් ඉවත් කර ගෙන තිබුණි. ඇ.ඩො. 5,880,000 ක්වූ ඉතිරි මුදල 2021 මාර්තු අවසන් වන තෙක් ගෙවා නොතිබුණි. | | |
| (ආ) | නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමක් වසර 30ක බද්දකට රු.24,220,118 ක් ගෙවා ඛනිජ වැලි සමාගමේ ප්‍රධාන කාර්යාලය ඉදිකිරීම සඳහා 2013 වර්ෂයේදී ලබාගෙන තිබුණි. වර්ග අඩි 15,325 ක මහල් 06 කින් සමන්විත මෙම ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා රු.171,453,486 කට (වැට් රහිත) 2018 මාර්තු කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.6 වගන්තිය ප්‍රකාරව ලංසුකරුවකු විසින් ඉදිරිපත්කරන ලද ලංසුව ප්‍රතිග්‍රහණය කිරීමෙන් පසු වහාම විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම සිදු කල යුතු වුවත් කොන්ත්‍රාත් ආයතනය සමඟ ගිවිසුම අත්සන් කර නීතිමය බැඳීමක් ඇතිකරගෙන තිබුණේ 2020 පෙබරවාරි 26 දින එනම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර වසර 02ක් ගතවීමෙන් පසුව විය. එහෙත් මෙම ගිවිසුමට කොන්ත්‍රාත් පිරිවැය, ගෙවීම් කොන්දේසි , කොන්ත්‍රාත් කාලය වැනි ප්‍රධාන පිරිවිතරයන් ඇතුලත් කර නොතිබුණි.<br><br>2020 මාර්තු ගොඩනැගිල්ල ඉදිකිරීම් ආරම්භ කර තිබූ අතර වසර 07 ක කාලයක් මෙම ඉඩම නිෂ්කාර්යව පැවතී තිබුණි. වසර 30ක බදු කාලයෙන් 2020 මාර්තු අවසන් වන විට වසර 8ක් ගෙවී ඇති මුත් මහල් 06 කින් යුත් මෙම ගොඩනැගිල්ලේ මහල් 04 ක් ඉහලට නැංවීම පමණක් සිදුකර තිබුණි. | වරින් වර කලමනාකාරිත්වයේ වෙනස්වීම් මත ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු වසර 2ක් ප්‍රමාද වී ඇත. දැනට ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ප්‍රශස්ථ මට්මමකින් පවත්වා ගෙන යනු ලැබේ. කොන්ත්‍රාත් ගිවිසුම ලංසු ප්‍රතිග්‍රහණය කළ විගසම අත්සන් කිරීමට නොහැකි වූ අතර CIDA ආයතනය මගින් අනුමත Form of Agreement (Refer SBD 02) භාවිතයෙන් ඉදිකිරීම් ආරම්භය සඳහා අවශ්‍ය කොන්ත්‍රාත්තුව අත්සන් කරන ලදී. කොන්ත්‍රාත් මුදලේ වෙනස්කම් සඳහා පමණක් තීරණ ගැනීමට අවකාශය දී ඇති අතර අනෙකුත් කොන්දේසි හා පිරිවිතර, කොන්ත්‍රාත් ලංසු පිරිනැමීමේදි එකඟවූ ආකාරයට පවතී. | ප්‍රධාන පිරිවිතරයන් ඇතුලත් විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීම හා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම කඩිනම් කළ යුතුය. |
| (ඇ) | පොඩුවකට්ටු සිට බර ඛනිජ වැලිපුල්මුඩේ යන්ත්‍රාගාරයට ප්‍රවාහනය කිරීම හා ඉඩම් නැවත පිරවීමට සහ වැලි ප්‍රවාහනය සඳහා මෙ.ටොන් 1ක් රු.234ක මිලට වූ ටෙන්ඩරයට ඉදිරිපත් වූ ලංසුකරුවන් 6කගෙන් එක් අයෙකු තෝරා 2020 මැයි 27 දින ටෙන්ඩරය ප්‍රදානය කර තිබුණද එම මිලට ලංසුකරු ඛනිජ වැලි ප්‍රවාහනය කර නොතිබුණි. එකඟ වූ මිලට ඛනිජ වැලි ප්‍රවාහනය නොකිරීමට අදාළව ලංසුකරුට එරෙහිව සමාගම කිසිදු ක්‍රියාමාර්ගයක්ද ගෙන නොතිබුණු අතර ඉතිරි ලංසුරුවන්ට වැලි ප්‍රවාහනය කිරීමට අවස්ථාව ලබා | පිළිතුරු සපයා නැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදෙශය අනුගමනය කර ආයතනයට වාසිදායක තීරණ ගත යුතුය. |

නොදී 2020 ජූලි 11 දින සමාගම විසින් මෙ.ටොන් එකකට රු.320 බැගින් ගෙවීමට එකඟවී පළමු ලංසුකරුටම අවස්ථාව ලබාදී තිබුණි. මුල් ලංසු ප්‍රදානය අනුව ගෙවීමට එකඟ වූ මුදල රු.20,439,258ක් වුවද මිල වෙනස් කිරීම නිසා රු.27,836,420ක් සැපයුම් කරුට ගෙවීම නිසා සමාගමට රු.7,397,161 ක අලාභයක් සිදු වී තිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂය තුළ සමාගමේ අපේක්ෂිත මුළු ඛණිජ විකුණුම් ප්‍රමාණය මෙ.ටොන් 113,996 ක් හා එහි විකුණුම් වටිනාකම රු.4,660,524,000ක් වුවත් සත්‍ය විකුණුම් ප්‍රමාණය මෙ.ටොන් 14,955 ක් වූ අතර එහි විකුණුම් වටිනාකම රු.696,597,134 ක් විය. ජාත්‍යන්තර තරඟකාරී ලංසුකරණය යටතේ ඉදිරිපත්වන ගැණුම්කරුවන් සීමිත වීම, විවිධ හේතූන් මත ටෙන්ඩර් අවලංගු වීම, එකවර විශාල තොගයක් අලෙවි කිරීමට කටයුතු කිරීම වැනි හේතූන් නිසා මෙලෙස අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට නොහැකිවී තිබුණි. මෙලෙස ක්‍රමවත් ලෙස සමාලෝචිත වර්ෂයේදී විකුණුම් සිදුනොවීමෙන් ආයතනයේ මූල්‍ය තත්ත්වය අයහපත්වී ද්‍රවශීලතාවය අඩුවීමෙන් දෛනික අවශ්‍යතා සඳහා කිහිප අවස්ථාවකදී රු. 450,000,000ක් වූ ස්ථාවර තැන්පතු 6ක් කල් පිරීමට පෙර ආපසු මුදල් කර ගැනීම හේතුවෙන් රු.7,573,770 ක අපේක්ෂිත පොලී ආදායම අහිමිවී තිබූ අතර කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ අපේක්ෂිත අලෙවිය සිදු නොවීම මෙන්ම තොග ඉවත් නොවීමෙන් ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවීම හා තොග සංරක්ෂණය දුර්වලවීම වැනි ගැටළු රැසකට සමාගම මුහුණදී තිබුණි. | 2020 මාර්තු මස ටෙන්ඩර කැඳවන ලද Rutile, Zircon, Hi Ti Ilmenite හා Ilmenite ඇතුලත් LMS/MKT/TDR/2020/01 ටෙන්ඩරය ගනුදෙනුකරුවන්ට ප්‍රදානය කිරීම සිදු වුයේ 2020 ඔක්තෝම්බර් මස වේ. Covid-19 වසංගත තත්වය හමුවේ අපේක්ෂිත අලෙවි ආදායම පහත වැටීමට ලක් විය. | විකුණුම් වර්ධනය කර ගැනීමට, නව ගැණුම්කරුවන් සොයා ගැනීමට හා ටෙන්ඩර් පරිපාටි නියමිත පරිදි අනුගමනය කර අවලංගුවීම් වළක්වා ගැනීමට ආයතනය කටයුතු කළ යුතුය. |
| (ආ) | Block A පැරණි යන්ත්‍රාගාරයේ නිෂ්පාදන ධාරිතාවය දළ වැලි යෙදවුම් පැයකට මෙ. ටො. 100 ක් වුවද වර්තමාන ධාරිතාවය පැයට මෙ.ටො. 40 හා 50 තරම් අඩු අගයක් විය. පූර්ණ ධාරිතාවයට සරිලන පරිදි යෙදවුම් යොමු නොකිරීම නිසා ලැබෙන අඩු නිමැවුම සමස්ථ නිෂ්පාදනාගාරයේම ක්‍රියාකාරිත්වයට | වසර 65කට අධික කාලයක සිට පුල්මුඩේ කේන්ද්‍ර කර ගනිමින් දළ වැලි කැනීම් කළ හෙයින් මෙවැනි තත්වයක් මතුවී ඇත. නව ඛනිජ නිධියෙහි බර ඛනිජ වැලි සංයුතිය ඉහළ අගයක පවතින හෙයින් ඉදිරියේදී උචිත යෙදවුම් භාවිතා කළ හැකිය. | ඉහළ සංයුතියකින් යුතු නව ඛනිජ වැලි නිධි සොයා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| අහිතකර ලෙස බලපා තිබුණි. මෙම යන්ත්‍රාගාරයේ **Spiral** නිර්මාණය කර ඇත්තේ අවම බර ඛනිජ වැලි ප්‍රතිශතය සියයට **40** සිට **80**දක්වා වන ඛනිජ වැලි වෙන් කිරීම සඳහා වුවත් නියැදිව ලබාගන්නා ලද සාම්පල වලට අදාල **2019** මාර්තු, අප්‍රේල්, සැප්තැම්බර් හා **2020** පෙබරවාරි, මාර්තු, අප්‍රේල් මාස වල පරීක්ෂණ වාර්තා අනුව දින කිහිපයක හැර අනෙක් සෑම දිනකම යෙදවුම් බර ඛනිජ ප්‍රතිශතය සියයට **40**ට වඩා අඩු විය. | | |
| (ඇ) සමාලෝචිත වර්ෂයේදී සමාගම සතුව ආරම්භක හා වර්ෂයේ නිෂ්පාදිත ඉල්මනයිට් තොග පිළිවෙලින් මෙ.ටොන් **77,247**ක් හා මෙ.ටොන් **15,419**ක් වූ අතර ඉන් ජනවාරි මස මෙ.ටොන් **5,436** ක් හා දෙසැම්බර් මස මෙ.ටොන් **5,053** ක් අළෙවිකර තිබුණි. සමාගම **2020** ඔක්තෝම්බර් මස අලෙවි කළ මෙ.ටොන් **85,000** ක් නිසි පරිදි මුදල් ගෙවා ගැනුම්කරු විසින් ඉවත් කර නොගැනීම නිසා සමාගම සතු මෙ.ටොන් **60,000**ක ඉල්මනයිට් ගබඩා කළ හැකි ගබඩා දෙකෙහි මුළු ධාරිතාවය ඉක්මවා ගොස් තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට මැයි දක්වා සැලකිය යුතු දින ප්‍රමාණයක් ඉල්මනයිට් නිෂ්පාදනය අත්හිටුවා තිබූ අතර **2020** ජුනි **01** සිට විගණිත දිනය වන **2021** මාර්තු **18** දින දක්වාම **Block B** යන්ත්‍රාගාරයේ නිෂ්පාදනය නවතා තිබීමෙන් **Block C** ඇතුළු අනෙකුත් යන්ත්‍රාගාර මෙන්ම සියළු සම්පත් එම කාලය දක්වා නිෂ්කාර්යව පැවතිණි. | **2020** මාර්තු මාසයේ දින කිහිපයක් කොරෝනා වසංගතය හේතුවෙන් යන්ත්‍රාගාරය අක්‍රියව පැවති අතර ගබඩා පහසුකම් සීමිත වීම හේතු කොට ගෙන **2020** මැයි මස **31** වන දින සිට **2021** මාර්තු මස **11** වන දින දක්වා යන්ත්‍රාගාරය අක්‍රියව පැවතිණි. එම කාල සීමාවේ යන්ත්‍රාගාරයේ අත්‍යවශ්‍ය අලුත්වැඩියා සහ නවීකරණ කටයුතු බොහොමයක් සිදුකර ගැනීමට ඉඩ පහසුකම් ලැබුණි. | තොග අලෙවි වූ වහාම ඒවා ඉවත් කර ගැනීමට ගැනුම්කරුට නියම කළයුතු අතර පමා කාලයට අදාලව ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3** මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **1990** මාර්තු **12** දින කර්මාන්ත අමාත්‍යාංශය විසින් අනුමත කරනු ලැබූ ප්‍රසාද දීමනා ගෙවීම් පටිපාටියේ **6 - B** ඡේදය ප්‍රකාරව ප්‍රසාද දීමනා ගෙවීම් කිරීම වර්ෂයේ ලාභය පදනම් කරගත යුතු බව දක්වා තිබුණද, එම පටිපාටියෙන් බැහැරව සමාලෝචිත වර්ෂයේ ලාභයක් නොලබා තිබිය දී ප්‍රධාන කාර්යාලයේ සේවකයින් සඳහා රු.**10,300,000** ක් හා පුල්මුඩේ යන්ත්‍රාගාරයේ සේවකයින් සඳහා | මෙම අත්තිකාරම් මුදලින් **50%**ක් සඳහා අදාළ අනුමැතිය ලබා දී ඇතත් **2021** වාර්ෂික ගිණුම් සැකසීමෙන් අනතුරුව ලැබෙන ලාභයට ගැලපීම් කිරීමට යටත්ව ආයතනයේ සේවකයින්ට දිරි දීමනා අත්තිකාරම් ලෙස රු.**100,000/=** ලබා දෙන ලදී. | අනුමත ප්‍රසාද ගෙවීම් පටිපාටියට අනුගතව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.49,200,000ක්ද වශයෙන් මුළු එකතුව රු.59,500,000 ක් ප්‍රසාද දීමනා අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. තවද මේ සඳහා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේද, අමාත්‍යාංශයේද, භාණ්ඩාගාරයේ ද අනුමැතියක් නොවීය. | | |
| (ආ) | සමාගම විසින් සභාපතිගේ ආරක්ෂාව සඳහා රු. 405,956 ක් වටිනා ගිනි අවියක් මිලදී ගැනීමට ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත අත්තිකාරම් වශයෙන් 2020 ඔක්තෝම්බර් 15 දින රු. 324,946 ක් ද 2021 මාර්තු 04 දින රු. 81,010 ක්ද ගෙවා තිබුණි. 2021 අප්‍රේල් 29 දින වන විට අදාල ගිනි අවිය සමාගමට ලැබී තිබුණද 2021 මැයි 10 දින වන විටත් භාණ්ඩ ලැබීම් පත්‍රයක්(GRN) නිකුත් කර නොතිබුණි. ඉහත මුදලට අමතරව 2020 සැප්තැම්බර් 30 දින cosmic technologies ආයතනයට මේ සඳහා අත්තිකාරම් වශයෙන් රු.100,000 ක් ද ගෙවා තිබුණි. එම ගෙවීම කුමක් සඳහාද යන්න විගණනයට අනාවරණය නොවුණි. එසේම ගිනි අවියක් මිලදී ගැනීමේ අවශ්‍යතාවය කුමක්ද යන්න විගණනයට පැහැදිලි නොවුණි. | පිළිතුරු ලබා දී නොමැත. | මුදල් අරපරිස්සමින් භාවිතා කිරීමට හා අනවශ්‍ය වියදම් නොදැරීමට වගබලා ගත යුතුය. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ දැනට පවතින Block A යන්ත්‍රාගාරයේ උපරිම ධාරිතාවය ලබාගැනීමට නොහැකි වීම හේතුවෙන් රු.39,481,066 ක මුදලක් වැයකර 2014 වර්ෂයේදී ආරම්භකර 2017 වර්ෂයේදී Block A නව යන්ත්‍රාගාරයේ ඉදිකිරීම් අවසන් කර තිබුණි. එහි ස්ථාපිත කිරීම සඳහා 2012 වර්ෂයේදී මිලදී ගත් රු.179,229,302 ක් වටිනා යන්ත්‍ර සූත්‍රද, කෝකිලායි ව්‍යාපෘතිය වෙනුවෙන් මිලදීගත් යන්ත්‍ර කොටස්ද මෙම යන්ත්‍රාගාරයේ සවිකර තිබුණද, 2019 ඔක්තෝම්බර් සිට විගණිත දිනය වූ 2021 අප්‍රේල් 30 දින වන විටත් මෙම යන්ත්‍රාගාරයේ නිෂ්පාදන කටයුතු සිදුකර නොතිබුණි. | මේ වන විට යන්ත්‍රාගාරයේ ඇති පරණ යන්ත්‍ර සූත්‍ර නව යන්ත්‍රාගාරයට ගෙන සවි කිරීමට අදාල මූලික කටයුතු සූදානම් කර ඇති අතර පැනල් බෝඩ් එකක්ද ඇනවුම් කර ඇත. පැරණි යන්ත්‍රාගාරයේ ඇති ඉතිරි යන්ත්‍ර එනම් ස්පයිරල් (Spiral) නව යන්ත්‍රාගාරයට සවි කිරීම අවසන් කර වැඩ ආරම්භ කිරීම සඳහා මූලික කටයුතු යොදා ඇත. මෙමගින් Feed Rate එක 40% සිට 50% කින් වැඩි කර ගැනීමට බලාපොරොත්තු වේ. | යන්ත්‍ර වලින් උපරිම ධාරිතාවය ලබා ගැනීමට කටයුතු කළයුතු අතර නිෂ්පාදන කටයුතු කඩිනමින් ආරම්භ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | **2013** වර්ෂයේදී ඛණිජ වැලි බහුලව පවතින හෙක්ටයාර් **17.6** ක බිම් ප්‍රමාණයක් කෝකිලායි ප්‍රදේශයෙන් සමාගම විසින් අත්පත් කරගෙන ඒ සඳහා රු.මිලියන **2.25** ක මුදලක් මුලතිව් දිස්ත්‍රික් ලේකම් වෙත **2012** වර්ෂයේදී ගෙවා තිබුණු අතර එම වර්ෂයේදීම කෝකිලායි ව්‍යාපෘතිය වෙනුවෙන් යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම සඳහා රු**39,339,473** ක් ද වැයකර තිබුණි. කැනීම් කිරීම සඳහා අවශ්‍ය කැණීම් බලපත්‍රය ලබාගෙන නොතිබීම මත සමාලෝචිත වර්ෂය දක්වාම එම ප්‍රදේශයේ කිසිදු කැනීම් කටයුත්තක් කර නොතිබුණි. තවද ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් වත්කම් සියල්ල පුල්මුඩේ යන්ත්‍රාගාරයේ වෙනත් ස්ථානවල ස්ථාපිත කර නිෂ්කාර්යව තිබුණු අතර ඇතැම් යන්ත්‍ර ගබඩාවේ නිෂ්කාර්යව ගොඩ ගසා තිබුණි. මෙම යන්ත්‍රවලින් ස්පයිරල් **24** ක් **Block A** පැරණි යන්ත්‍රාගාරයේ සවිකර තිබුණ ද ඒවාද ක්‍රියාකාරී තත්වයේ නොතිබුණි. එසේම **2015** වර්ෂයේදී කෝකිලායි ව්‍යාපෘතිය සඳහා සේවකයින් **117** දෙනෙකු බඳවාගෙන ඔවුන් යන්ත්‍රාගාරයේ විවිධ ස්ථාන වලට අනුයුක්ත කර තිබුණි. ඒ අනුව අතිරික්ත සේවක සංඛ්‍යාවක් පැවතීමෙන් නිෂ්පාදන වල පිරිවැය ඉහල යාමට එයද බලපා තිබුණි. | **2013** වර්ෂයේ සිට වසර කිහිපයක් එම **Spiral** නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා භාවිතා කරන ලදී. නමුදු **Spiral** සඳහා ජලය රැගෙන යනු ලබන නල පද්ධතියේ ඇති සිදුරු කුඩා බැවින් එය නිරන්තරයෙන්ම අවහිර වේ. එම නිසා මේ වන විට අදාළ ගැටලුව සම්බන්ධව නිෂ්පාදන ආයතන සමග සාකච්ඡා කිරීමෙන් පසු එම ගැටලුවට අදාල විසඳුමේ **Drawing** අපට ලබා දී ඇත. ඒ අනුව ඉදිරියේදී එම නල පද්ධතිය නැවත යථා තත්වයට පත්කර නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීමට බලාපොරොත්තු වේ. | කෝකිලායි ව්‍යාපෘතිය කඩිනමින් ආරම්භ කළයුතු අතර යන්ත්‍රසූත්‍ර ද නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගෙන ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ඉන්ධන වියදම් සියයට **50** කින් ඉතිරිකර ගැනීම සඳහා රු.**62,370,234** ක් වටිනා ඩ්‍රයර් යන්ත්‍රයක් **2016** ජුනි **30** දින ආනයනය කර ඒ සඳහා රු.**1,164,350**ක ප්‍රමාද ගාස්තු ඇතුළුව රු.**43,838,767**ක් **2020** දෙසැම්බර් **31** දින වන විට සමාගම විසින් ගෙවා තිබුණු අතර වසර **5**ක් ගතවුවද, මෙම යන්ත්‍රය ක්‍රියාත්මක තත්වයට පත්කර නිෂ්පාදන කටයුතුවලට යොදා ගැනීමට **2021** මාර්තු **21** දින වන විටත් සමාගමට නොහැකිවී තිබුණද ඒ සම්බන්ධයෙන් වගකිව යුතු නිළධාරින් හඳුනාගෙන ඔවුනට එරෙහි ක්‍රියාමාර්ග ගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණි. | මෙය ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ කටයුතු මේ වන විට **75%** ක් අවසන් කර ඇත. වැඩ කටයුතු කර ගෙන යාමට අවශ්‍ය රහස්‍ය අංකය **(password)** නොමැති බැවින් අවසන් කිරීමට නොහැකි වීම නිසා ඉදිරියේදී එයට අදාල **Software** එක නැවත ලිවීමට හෝ වෙනස් කිරීමට අදාල කටයුතු ඉදිරියේදී ක්‍රියාත්මක කරනු ලැබේ. | යන්ත්‍රය ක්‍රියාත්මක තත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කළ යුතු අතර වගකිව යුතු නිලධාරින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාගමේ නිෂ්පාදන කටයුතු වර්ධනය කරගැනීම සඳහා හදිසි මෙන්ම අත්‍යාවශ්‍ය මිලදී ගැනීමක් ලෙස සලකා තෙත වැලි යන්ත්‍රාගාරයට නව Hydroziser යන්ත්‍රය මිලදී ගැනීම සඳහා සමාගම විසින් ඕස්ට්‍රේලියානු මිනරල් ටෙක්නොලොජීස් හි නියෝජිත ශ්‍රී ලාංකීය සමාගමක් මඟින් ආනයනය කිරීමට 2014 වර්ෂයේදී තීරණය කර 2016 ජනවාරි මස රු.15,426,302 කට මිලදීගෙන තිබුණි. මිලදීගෙන වසර 4ක් ගතවුවද, මෙම යන්ත්‍රය නිෂ්පාදන කටයුතුවලට යොදාගැනීමට 2021 මාර්තු 21 දින වන විටත් සමාගම කටයුතු කර නොතිබුණි. ඒ අනුව මෙම යන්ත්‍රය හදිසි අවශ්‍යතාවයන් මත මිලදී ගත් යන්ත්‍රයක් නොවන බව පැහැදිලි වුවද යන්ත්‍රය මිළදී ගැනීම සම්බන්ධයෙන් වගකිව කිවයුතු නිලධාරින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි. | මෙම යන්ත්‍රයට වතුර යොදා පරීක්ෂා කර ඉන් පසු වැලි යොදවා පරීක්ෂා කිරීම සිදු කරමින් පවතියි. ඉදිරි සතිය තුල එය නිෂ්පාදන කටයුතු සඳහා දිගටම යොදවා ගැනීමට නියමිතය. | යන්ත්‍රය නිෂ්පාදන කටයුතුවලට යොදාගැනීමට කටයුතු කළ යුතු අතර වගකිව යුතු නිලධාරින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | 2004 වර්ෂයේ සිදු වූ සුනාමි ව්‍යසනයෙන් පුල්මුඩේ යාත්‍රාංගණය විනාශවීමෙන් පසු කොඩ්බේ යාත්‍රාංගණයද භාවිතයට ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් එහි තිබු ටග් හා බත්තල් යාත්‍රා ප්‍රයෝජනයට නොගෙන වසර 16 කට වැඩි කාලයක් දිරා පත්වෙමින් පැවතියද අදාල යන්ත්‍රාගාරය පැවරිමට හෝ අපහරණය කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ වන විට ටග් යාත්‍රා හා බත්තල් වල තක්සේරු කටයුතු සිදු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. ඒ අතර අදාල තක්සේරු කටයුතු සිදු වූ පසු ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිනීමට කටයුතු සූදානම් කර ඇත. | යාත්‍රා අලෙවි කිරීමට, පැවරිමට හෝ අපහරණය කිරීමට ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ඊ) | වසර 3 ක සිට ධාවනයෙන් ඉවත් කර අළුත්වැඩියා කටයුතු සඳහා යොදවා තිබු වාහන 04 ක් අළුත්වැඩියා කර ධාවනය සඳහා යොදවා නොතිබුණු බව අනාවරණය විය. | අළුත්වැඩියාව සඳහා මිල ගණන් කැඳවා ඇත. | කඩිනමින් අළුත්වැඩියා කර ධාවනය සඳහා යොදවා ගත යුතුය. |

### 3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 අගෝස්තු 15 සිට 2028 අගෝස්තු 15 දක්වා වසර 10 ක් සඳහා තෙව්ක්කල්ලු ප්‍රදේශයේ හෙක්ටයාර් 4.5 ක වපසරියකින් යුක්ත වූ නිධියෙහි ඛනිජ වැලි කැනීම් කිරීම සඳහා බලපත්‍ර ලබාගෙන තිබුණද, | 2017 වර්ෂයේ මැයි මාසයේ සිට දෙසැම්බර් මස වන තෙක් එම ප්‍රදේශයේ දළ වැලි කැනීම් කටයුතු සිදු කල නමුත් ත්‍රිකුණාමලය පුල්මුඩේ ප්‍රධාන මාර්ගයේ ඇති පාලමක් අබලන් | කැනීම් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | **2021** මාර්තු වන විටත් එහි කැනීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | වීම හේතුවෙන් මාර්ග සංවර්ධන අධිකාරියෙන් එම කටයුතු තාවකාලිකව නවත්වන ලෙස යන්ත්‍රාගාරය වෙත උපදෙස් ලබා දුනි. වර්තමානය වන විට එම පාලමේ කටයුතු නිමවී ඇති හෙයින් ඉදිරි සති දෙක ඇතුලත එම කටයුතු ආරම්භ කිරීමට සූදානම් කර ඇත. | |

**3.6** ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ යන්ත්‍රාගාරය සඳහා වටිනාකම රු.**73,165,328** ක් වූ **Wet High Intensity Magnetic Separator with a Control Panel Board** යන්ත්‍රය මිලදී ගැනීම් ආනයන ක්‍රියාවලියේදී කළමණාකාරිත්වය විසින් කලට වේලාවට තීරණ නොගැනීම, ටෙන්ඩර් ප්‍රදානය **2018** පෙබරවාරි **12** දක්වා ප්‍රමාදවීම, ණයවර ලිපි(**LC**) විවෘත කිරීම **2019** අගෝස්තු **12** දක්වා ප්‍රමාද වීම හා නියමිත දිනට මිල දී නොගැනීම ආදි දීර්ඝ ප්‍රමාදයන්හේතුවෙන් අදාල කාල පරාසය තුළ ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අවප්‍රමාණය වීම හේතුවෙන් සමාගමට රු.**11,660,234** ක විනිමය පාඩුවක් දැරීමට සිදුවී තිබුණි. | සැපයුම්කරුට ටෙන්ඩරය ප්‍රදානය කිරීමට අධිකරණ නියෝග මත ප්‍රමාද වීම නිසා එම මිල ගණන් යටතේ භාණ්ඩ සැපයීමට නොහැකි බවත් මිල **20%**කින් පමණ ඉහළ ගොස් ඇති බවත් ප්‍රකාශ කරන ලදී. පසුව විදේශීය සැපයුම්කරු සමග සාකච්ඡා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ටෙන්ඩරය ප්‍රදානය කල මිලටම එම භාණ්ඩ සැපයීමට සැපයුම්කරු එකඟ විය. ණයවර ලිපිය ඔවුන් වෙත ලැබී සති **26** ක කාලයට අමතරව තවත් සති **08**ක් අවශ්‍ය බවත් එය ලබා දීමට එකඟවීම මත **LC** විවෘත කරන ලදි. **LC** විවෘත කිරීම ඇමරිකානු ඩොලරය මගින් සිදු කල අතර ඩොලරයට සාපේක්ෂ රුපියල අධි ප්‍රමාණය හා අව ප්‍රමාණය වීම මත විනිමය ලාභය හෝ පාඩුව අපගේ පාලනයෙන් බැහැර වූවකි. | ටෙන්ඩර ප්‍රදානයෙන් පසු කඩිනමින් මිලදී ගැනීම් කටයුතු සිදුකළ යුතුය. |
| (ආ) | වසර ගණනාවක සිට බැහැර කරන ලද අබලි යකඩ, පස් කපන යන්ත්‍ර, ටේලර්, ලොරි, වාහන එන්ජින්, ස්පයිරල්, ට්‍රැක්ටර්, වෑන්, **JCB 5** ක් පමණ හා වෙනත් යන්ත්‍ර කොටස් යන්ත්‍රාගාර භූමියේ අනාරක්ෂිතව දමා තිබූ අතර ඒවා අපහරනය කිරීමට කටයුතු කර නොතිබුණි. | අපගේ ආයතනයෙන් බැහැර කරන ලද අබලි යකඩ හා වෙනත් යන්ත්‍ර කොටස් විකිනීම සඳහා මේ වන විට මිල කැඳවීම් සිදු කර ඇති අතර ඉදිරියේදී එය විකිනීමට කටයුතු සූදානම් කර ඇත. | අපහරණය කිරීමට ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ඇ) | යන්ත්‍රාගාරවලින් ඉවත්වන (සුදුවැලි ) තොගවලට අමතරව පෙරසැරි කරන ලද ඛනිජවැලි තොග සමාගමේ විශාල භූමි ප්‍රදේශයක විවිධ ස්ථාන වල අනාරක්ෂිතව වසර කිහිපයක සිට ගොඩ ගසා තිබූ අතර එම වැලි තොග අලෙවි කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් භූමියේ ඉඩකඩ ඇහිරී තිබුණි. | ආයතනයේ ඉහළ කළමනාකාරිත්වය විසින් තීරණය කොට ඇති පරිදි අතුරු නිෂ්පාදන පෙරහැරි කිරීමකින් තොරව විකිනීම අත්හිටුවා ඇති අතර ඒවා නැවත පිරිපහදු කිරීමෙන් අනතුරුව විකිනීමට කටයුතු කර ඇත. | වැලි තොග අලෙවි කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) එම්. වී. කොඩියැලිටි නෞකාවේ මුළු බර මෙ.ටොන් 7,763ක් පමණ වන අතර ඉන් ඉවත් කරගෙන ඇති යකඩ ප්‍රමාණය මෙ.ටොන් 3,120 ක් පමණ වේ. 2005 වර්ෂයේ සිට මේ වන විට වසර 16ක් ගතවී ඇතත් ගිවිසුම් ප්‍රකාරව ආශා ලංකා ආයතනය විසින් නැව ඉවත්කර නොගැනීම හේතුවෙන් පරිසර හානියක් මෙන්ම පුල්මුඩේ විවෘත වරායේ කටයුතු ඇනහිටීමෙන් මූල්‍යමය පාඩුවක්ද, සිදුවී ඇත. 2014 වර්ෂයේදී එහි වූ ඉල්මනයිට් තොගයෙන් කොටසක් ආශා ලංකා සමාගම විසින් ගොඩට ගෙන තිබූ අතර ඒවා අලෙවි කිරීමට හෝ ඉවත් කිරීමට ක්‍රියාමාර්ගයක් නොගෙන වසර 7ක් තිස්සේ සමාගම් පරිශ්‍රයේ අනාරක්ෂිතව ගෙඩගසා පැවතුණි. | මෙම වැලි තොගයේ අයිතිය අප ආයතනයට නොමැති හෙයින් පූර්ණ අයිතිය අදාළ පෞද්ගලික ආයතනයක් වන ආශා ලංකා එන්ටර්ප්‍රයිසස් ආයතනය සතුවේ. තවද එම වැලි කඩිනමින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් එම ආයතනය වෙත උපදෙස් ලබා දී ඇත. අදාල නැවෙන් ඉතිරි කොටස් ඉවත් කිරීමේ කටයුතු මෙම මස සිට ආරම්භ කිරීමට සූදානම් බව අප වෙත දන්වා ඇත. | ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.7 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1997 දෙසැම්බර් 02 දින සිට පරිපාලන නිලධාරි තනතුර දරමින් සිටිය දී විනය පරීක්ෂණයකට අනුව චෝදනා 11 කට වැරදිකරු ලෙස නිගමනය ලදුව 2017 සැප්තැම්බර් 15 දින සිට සමාගමේ සේවයෙන් පහකළ නිලධාරියකු සභාපතිවරයා විසින් සමාගමේ නියෝජ්‍ය සමාන්‍යාධිකාරි (මානව සම්පත්) තනතුර සඳහා 2020 අප්‍රේල් 01 දින සිට රු.120,000 ක මාසික දීමනාවකට ද, 2020 ඔක්තෝබර් 12 දින සිට අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත පුල්මුඩේ යන්ත්‍රාගාරයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (HM1 -3) තනතුරේ වැඩ බැලීමටද පත් කර තිබුණු අතර අදාල නිලධාරියා වෙනුවෙන් 2020 අප්‍රේල් සිට 2021 මාර්තු දක්වා දීමනා ලෙස රු.2,052,898 ක් සමාගමෙන් ගෙවා තිබුණි. මෙම අයථා පත් කිරිම නිවැරදි කිරීමට හා ඒ වෙනුවෙන් කරනලද ගෙවීම් වගකිවයුතු නිළධාරින්ගෙන් අයකර ගැනීමට සමාගම මෙන්ම අමාත්‍යාංශයද කටයුතු කර නොතිබුණි. | 2020 මැතිවරණයක් ප්‍රකාශයට පත් කර තිබීම හා කොවිඩ් 19 වසන්ගත තත්වය යටතේ ස්ථිර ලෙස නිලධාරියකු බඳවා ගැනීමට හැකියාවක් නොපැවති බැවින් පාලනාධිකාරිය විසින් ගනු ලැබූ තීරනයකට අනුව එච්.බී.එන්.ඩබ්.අනුර කුමාර මහතා ඉහත තනතුරට 2020.04.01 වෙනි දින සිට රු.120,000/-ක දීමනාවක් ගෙවීමට යටත්ව වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන හා මානව සම්පත්) ලෙස පත් කර ඇත. | අයථා පත් කිරිම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සභාපතිවරයාගේ පෞද්ගලික සහකාර තනතුරට පත්කල නිලධාරියා හට සමාගමෙන් 2020 මාර්තු | සභාපතිතුමාගේ රහස්‍ය ලේකම් තනතුරේ නිලධාරියෙකු නොමැති වීමෙන් එම කටයුතු සඳහා සභාපති පෞද්ගලික සහකාර ලෙස කාර්ය | අයථා පත් කිරිම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සිට 2021 පෙබරවාරි දක්වා දීමනා ලෙස රු.646,749 ක්ද, අතිකාල වශයෙන් 500,000 ක්ද පුල්මුඩේ ගමන් කිරීම සඳහා දිනකට රු.1000 බැගින් රු. 60,000 ක් ද වශයෙන් රු 1,206,749 ක් ගෙවීම් කර තිබුණි. මෙම තනතුර අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ නොමැති තනතුරක් වන අතර අනිසි ලෙස බඳවා ගෙන ඒ වෙනුවෙන් කරනලද ගෙවන ලද වැටුප් හා දීමනා වගකිව යුතු නිළධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පැවරීමේ පදනම මත පුද්ගලයෙකු 2020.03.02 වෙනි දින සිට තාවකාලිකව පත් කර ගෙන ඇත. මෙම පත් කිරීම 2021.06.30 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි අවසන් කර ඇත. | |
| (ආ) සමාගමේ උසස් කිරීම් පිළිබඳ සිදු කළ නියැදි පරික්ෂාවේදි බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට පටහැනිව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතියකින් තොරව සමාගමේ සභාපති විසින් නිලධාරීන්ට පෞද්ගලික වන ලෙස වැටුප් කේත වෙනස් කරමින් තනතුරු උසස් කර වැටුප් ගෙවා තිබුණි. | නව බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටිය 2013.06.13 වෙනි දින අනුමත වී ඇත. එබැවින් එදිනට පෙර 2013.06.12 වෙනි දින දක්වා ක්‍රියාත්මක වූ පැරණි බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය ප්‍රකාරව ශ්‍රේණිගත අභ්‍යන්තර උසස් වීම් ලබා ගෙන ඇත. | බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට බැහැරව කටයුතු නොකළ යුතුය. |
| (ඇ)සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු වන ප්‍රධාන රසඥ තනතුර වසර 10 ක සිටද වෛද්‍ය නිළධාරි තනතුර වසර 05 ක සිටද ජ්‍යෙෂ්ඨ සාමාන්‍යාධිකාරි( මූල්‍ය) හා ජ්‍යෙෂ්ඨ සාමාන්‍යාධිකාරි (මානව සම්පත්) යන තනතුරු 2019 අප්‍රේල් මස සිටද පුරප්පාඩුව පැවතුනි. මේ දක්වා ස්ථිර නිලධාරින් මෙම තනතුරු සඳහා බඳවාගැනීමට සමාගමට නොහැකි වී තිබුණි. | මේ වන විට සේවයේ යෙදී සිටින රසඥ මහතුන් දෙදෙනා රසායනාගාරයට අයත් රාජකාරි කටයුතු ඉටු කරනු ලබයි. | ප්‍රධාන තනතුරු සඳහා නිලධාරීන් කඩිනමින් බඳවා ගතයුතුය. |
| (ඈ)2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේ දී ප්‍රධාන කාර්යාලයේ තනතුරු නාම 07ක නිලධාරින් 13 දෙනෙකුගේ පුරප්පාඩුද, තනතුරු නාම 03 ක නිලධාරින් 19 දෙනෙකුගේ අතිරික්තයක්ද නිරීක්ෂණය වූ අතර පුල්මුඩේ යන්ත්‍රාගාරයේ තනතුරු නාම 12 ක නිලධාරීන් 119 දෙනෙකුගේ පුරප්පාඩුද තනතුරු නාම 04ක නිලධාරින් 20 දෙනෙකුගේ අතිරික්තයක්ද නිරීක්ෂණය විය. | රේඛීය අමාත්‍යංශයේ අනුමැතිය මත ඉදිරියේදි එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ හැකිවේ. අතිරික්ත සේවකයින් අනුමත සේවක සංඛ්‍යාවට පිටින් බඳවා ගැනීම් කර නොමැත. | සේවක අතිරික්තයක් ඇති නොවන පරිදි පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) සමස්ථ ආයතනයේ නිෂ්පාදන, පරිපාලන, ගිණුම් හා අනෙකුත් කාර්යයන් සම්බන්ධයෙන් ගනු ලබන ප්‍රතිපත්ති හා තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා 2015 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින සාමාන්‍යාධිකාරී තනතුර ස්ථිරව පිරවීමට කටයුතු කල යුතු වුවත් එසේ නොකර අදාළ තනතුර සඳහා ද්විතික පදනම මත නිලධාරින් බඳවාගෙන තිබුණි. | ආයතනයේ කටයුතු අකර්මන්‍ය නොවන ලෙස පවත්වා ගෙන යාම වෙනුවෙන් ද්විතීය පදනම මත සහ වැඩ බැලීමේ පදනම මත රේඛීය අමාත්‍යාංශය විසින් සාමාන්‍යාධිකාරිවරුන් පත් කර ඇත. | ස්ථිර නිලධාරියකු බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අභ්‍යන්තර විගණන ඒකකය සඳහා ජ්‍යෙෂ්ඨ කලමනාකරණ මට්ටමේ නිලධාරීන් දෙදෙනෙකු ඇතුළුව නිලධාරින් පස් දෙනෙකු අනුයුක්ත කර තිබුණද, විගණන සැලැස්මට අනුව ප්‍රමාණවත් විගණනයක් සිදුකර නොතිබුණි. | 2021 වර්ෂයේදී මෙම තත්වය අවම කර ගැනීම සඳහා කටයුතු කරනු ලැබේ. | විගණන සැලැස්ම පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) 2018 අංක 19 දරන විගණන පනතේ 38(ඊ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගනන්දීමේ නිලධාරි විසින් සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීතාව පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත් එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් එවැනි සමාලෝචනයක් කල බවට තොරතුරු නොවීය. තවද විගණන පනතේ 40(4) වගන්තිය ප්‍රකාර අභ්‍යන්තර විගණන වාර්තා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සමාගමේ මූලික කාර්යයන් ආවරණය වන පරිදි සමස්ථ පද්ධති සමාලෝචනයක් 2021 වර්ෂයේ සහ 2022 වර්ෂවලදි සිදු කිරීමට සැලසුම් කර ඇත. | ප්‍රමාණවත් විගණනයක් සිදුකළයුතු අතරම විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4.2** අයවැය පාලනය
------------------

| විගණන නිරීක්ෂණය<br>-------------------- | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම<br>------------------------------------ | නිර්දේශය<br>---------- |
|---|---|---|
| අයවැයගත විකුණුම් වලට වඩා සත්‍ය විකුණුම් රු.මිලියන 3,964 කින් හෙවත් සියයට 85 කින් අඩුවී තිබුණි. එසේම පරිපාලන වියදම් රු.මිලියන 79 ක් එනම් සියයට 31 ක් ඉතිරිවී තිබුණු අතර වෙනත් පොදු කාර්ය වියදම් අයවැයගත ප්‍රමාණයට වඩා රු.මිලියන 250 ක් එනම් සියයට 78 ක් වැඩියෙන් වියදම් කර තිබුණි. ඒ අනුව අයවැයගත ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | කොවිඩ් 19 තත්ත්වය හා 2020 නොවැම්බර් මස ටෙන්ඩරය පිරිනැමුවද තෙග ඉවත් කර නොගැනීම ආදායම අඩුවීමට හේතු වී ඇති අතර සාමාන්‍ය වියදම් ඉහළ යාමක් සිදුවී ඇත. | අයවැයගත ඉලක්කයන් අනුව කටයුතු කර අරමුණුගත ඉලක්කයන් ළඟාකරගැනීමට කළමනාකාරිත්වය කටයුතු කල යුතුය. |